හැන්දෑවේ ගේ පිටිපස්සේ පොල් ගහේ බැන්ද එළදෙන උදේ බලන කොට දකින්නට නැත්නම් කවුරුහරි හරකා මස් කිරීම ගැන ගැමියන් දෙස් දෙවොල් තැබීම අපටත් මස් කර්මාන්තයක් ඇති බව හැඟවෙන සලකුණකැයි අපේ ආහාර හා කෘෂිකර්ම ඇමතිවරයෙකු වරක පවසා ඇත. කොළඹ මස් කඩ වල මස් හිඟ වීමත් අපේ ඉංග්‍රීසි පත්තරකාරයනට ජාතික ප්‍රශ්ණයකැයි අවිහිංසා නායකයකු වරෙක මැසිවිලි නැගීය.



ලෝක ප්‍රකට හෙරිෆෝඩ් වර්ගයේ මස් හරකෙක්

## කිරටත් මසටත් එකසේ බලපාන

# අපේ මස් වෙළඳ රටාව

මෙය සමාජ මට්ටම දෙකකට ප්‍රශ්නයක් බලපාන අයුරු මෙන්ම අපටත් මස් කර්මාන්තයක් ඇති බව පෙන්වන ප්‍රකාශ බැව් පැහැදිලිය. තමන්ට අවශ්‍ය පෝෂ්‍ය පදර්ථ ලබා ගත හැකි වෙනත් මාර්ග ඇතත්, ආදියේ සිටම මිනිසුන් මස් කෑමට රුචියක් දක්වූ බවට ඇති සාධක අපමණය. මස් අතුරිනුත් හරක් මස් ඉතා ජනප්‍රිය වීම මස් කර්මාන්තය හා කිරි පට්ටි සංවර්ධනය අතර ගැටළුවක් මතු කර ඇත. දෑඩි සංස්කෘතික ආභාෂයන්ට ලක්ව ඇති ආසියාතු රටවල මෙය වෙසෙසින්ම දක්නට ලැබෙන්නකි. හරක් මස් කෑම ප්‍රචලිත වීම විදේශිකයන් අපට දුන් තවත් දයාදයක් ලෙස ද සැලකේ.

මස් පිළිබඳව තම පෞද්ගලික අදහස් උදහස් කුමක් වුවත් ශ්‍රී ලංකා වාසීන් ද හරක් මස් කෑමට ලොල් බව රහසක් නොවේ. මෙරට අනුභව කරන මස් වලින් 90% ක්ම හරක් මස් වේ. වසරකට මෙරට පුද්ගලයකු මස් රාත්තල් පහක් පමණ අනුභව කරන බව හෙළි වී ඇත. ලෝක මට්ටමින් මෙය ඉතා අඩු ප්‍රමාණයකි. එහෙත් මේ අඩු ප්‍රමාණය සැපයීම සඳහා පවා වසරකට අප ගව සම්පතින් 3,50,000 ක් පමණ මැරීමට සිදුවන බව ගණන් බලා තිබේ.

අප ජනතාවට අවශ්‍ය සෙසු ප්‍රධාන ආහාර නිෂ්පාදනය හා බෙදා හැරීම යම් තරමකින් හෝ ජාතික මට්ටමකින් සංවිධානය වී ඇත. මස් කර්මාන්තයේ තත්වය මීට හාත්පසින්ම වෙනස් ය. එදත් අදත් ගෙවන මුදලට අඩු තරමින් මස් රාත්තලක් ලැබේද යන දෙගිඩියාව තවමත් පාරිභෝගිකයා තුළ පැලපදියම්ව තිබීම මස් වෙළඳ රටාවේ කිසිදු වෙනසක් සිදුව නැති බව මනාව පෙන්වන්නකි. මෙරට මස් කර්මාන්තය පුද්ගලයන් දහ දෙළොස් දෙනෙකුගේ අණසකට යටත්ව පවතින්නක් බව මස් වෙළඳාම ගැන හොඳ අත්දැකීම් ඇති පුද්ගලයෙක් ප්‍රකාශ කොට ඇත.

මෙහි දී අප මස් කර්මාන්තයේ පසුතලය පිරික්සීම වැදගත් ය. අනෙක් බොහෝ රටවල මෙන් මෙහිද මස් ලබා ගනුයේ කිරට මෙන්ම වැඩට අපට ඇති එළහරක් හා මීහරක් මැරීමෙනි. දේශීය ගව සම්පත බහුලව ඇති වියළි කලාපයෙන් මස් පිණිස මරණ සතුන්ගෙන් 80% ක් පමණ සැපයේ. 1968 වර්ෂයේ පමණක් එළහරක් 2,44,000 ක් හා මීහරක් 90 000 ක් මරණ ලදැයි ගණන් බලා ඇත. හොඳින් වැඩුණ එළහරකකුගේ සාමාන්‍ය බර රාත්තල් 350 ක් පමණ වන අතර, මස් රාත්තල් 150 ක් පමණ ලබගත හැක. මී හරකුන්ගේ බර රාත්තල් 600 700 පමණ වන අතර, මස් රාත්තල් 150 ක් පමණ ලබා ගත හැකි ය.

අනෙකුත් සියළු නිෂ්පාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන ඇතත් මස් කර්මාන්තය පිළිබඳ එසේ ගණන් හිලව් නොමැතිවීම එහි තවත් ප්‍රධාන ලක්‍ෂණයකි. මස් කර්මාන්තය පිළිබඳව ගණන් බැලීම් කිරීමට නිතරම සිදුවේ. හොර හරක් ජාවාරම මෙරට ජයටම සිදුවීම මීට හේතුවයි. ඇතැම් ප්‍රදේශවල හොරෙන් මරන සතුන් ගණන නීත්‍යානුකූලව මරන ප්‍රමාණය මෙන් දෙතුන් ගුණයක් වන බව හෙළිව ඇත. 1958 සත්ව ආඥා පණතට අනුව සියළුම සතුන් ග්‍රාම සේවක තැන වෙත ලියාපදිංචි කළයුතුය. ඔහුගෙන් ලබා ගන්නා අයිතිය පිළිබඳ අනුමතිය නොමැතිව හරක් විකිණිය නොහැක. ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරියාගේ අනුමැතිය නොමැතිව සතුන් මැරිය නොහැක. කිරට සුදුසු දෙනුන් හා ගොවිතැන් වැඩට ගත හැකි මී හරක් මැරීම සම්පූර්ණයෙන් ම තහනම් ය ප්‍රාදේශීය උප දිසාපතිවරුන්ගේ බලපත්‍ර නොමැතිව හරක් දිස්ත්‍රික්කයෙන් බැහැර ගෙන යාම තහනම් ය. නීති රීති එසේ තිබුණද දිවයින පුරාම හොර හරක් මැරීම සංවිධානාත්මක අන්දමින් කෙරෙන බව රහසක් නොවේ අප ගව සම්පතින් වැඩි ප්‍රමාණයක් අයිති සුළු ගොවියන් හා ගම්මුන් හොර හරක් ජාවාරමුන්ගේ ගොදුරුවලට නිතොරවම ලක් වේ.

### සංවිධානය

දිවයින පුරා ගව ඝාතකාගාර 150 ක් පමණ වේ පළාත් පාලන ආයතනවල පාලනය යටතේ මෙම ඝාතකාගාර පැවැත්වේ. දැඩි සනීපාරක්‍ෂක තත්වයන් යටතේ නීති රීතිවලට අනුකූලව සතුන් මරා, මස් කර විකිණියයුතු වුව ද එසේ කෙරෙනවාට වඩා නොකෙරෙන බව සත්‍යයකි සමහර පෙදෙස්වල ගවමඩු වැනි තැන්වල දී පවා සතුන් මස් කරන බව හෙළිවී ඇත. සනීපාරක්‍ෂක කටයුතු පිරික්සීම ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරි තැනට පැවරී ඇත. ඔහුට පැවරී ඇති රාජකාරී බහුලවීම නිසා මෙය හරිහැටි ඉටු කිරීමට ඉඩ නොසැලසේ.

තම ජනතාවට අවශ්‍ය මස් සැපයීම සඳහා ක්‍රමානුකූල සංවිධාන රටාවක් ඇත්තේ කොළඹ, මහනුවර හා නුවරඑළිය මහ නගර සභාවලට පමණි. ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ සුපරීක්‍ෂාව යටතේ කොළඹ සතුන් මස් කරනු ලැබේ. දිනක කොළඹ මස් අවශ්‍යතාව රාත්තල් 70,000 ක් පමණ වේ. මස් වෙළෙන්දන් විසින් ගෙන එනු ලබන සතුන් පශු වෛද්‍ය නිලධාරින්ගේ පරීක්‍ෂාව යටතේ මරනු ලබන ගව ඝාතකාගාරයක් නගර සභාව සතුය. දිනකට සතුන් 160 ක් පමණ මෙහි දී මස් කරනු ලැබේ. කොළඹට මස් සපයන තොග වෙළඳුන් 14 ක් පමණ සිටිති. මොවුන්ට සතුන් සපයන ප්‍රධාන ඒජන්තලා 100 ක් පමණ දිවයින පුරාම වේ මොවුන් තම ගම් මට්ටම් හවුල් කරුවන් ලවා සතුන් එකතු කරනු ලැබේ.

> **මස් වෙළඳාම නිෂ්පාදක-පාරිභෝගික යන දෙදෙනාගේ යහපත තකා සකස් විය යුතු නැව් කිවමනා නොවේ. පාරිභෝගිකයා මස් රාත්තලකට ගෙවන මුදලින් හරි අඩක්වත් නිෂ්පාදකයාට නොලැබෙන්නේ නම් ක්‍රමානුකූල මස් සැපයුමක් ඇති කළ නොහැක.**

දියුණු මස් කර්මාන්ත ඇති රටවල එය නිෂ්පාදකයා, ඉල්ලුම හා පාරිභෝගිකයා යන සාධක අනුව සකස්ව ඇත. මෙරට මස් සැපයුම ඉල්ලුම සපුරාලීමට තරම් ප්‍රමාණවත් නොවේ. කොළඹට අවශ්‍ය රාත්තල් 70,000 න් සැපයෙනුයේ 60% පමණි. මේ හැර අප මස් කර්මාන්තයේ ප්‍රධාන තැනක් ගන්නේ නිෂ්පාදකයාවත් පාරිභෝගිකයාවත් නොව අතරමැදියන් ය. මස් සඳහා සතුන් විකුණනු ලබන්නේ ද මස් පිණිස සතා වැඩී ඇත්ද යන්න මත නොව නිෂ්පාදකයා එදිනෙද මුහුණ පාන මුදල්මය අවශ්‍යතා අනුව ය. මහ කන්නයේ වී විකුණා ආදායම් ලබන ජනවාරි මැයි මාසවල තම සතුන් විකිණීමට ගොවීහු උනන්දු නොවෙති. ජුනි-දෙසැම්බර් කාලය සතුන් අලෙවිය ඉහළින් සිදු වන්නකි. වියළි කලාපයට ඇති දැඩි නියඟය සතුන්ට ආහාර හා ජලය සැපයීමේලා ප්‍රශ්න මතු කරවයි. මුදල් අතින් ද ගොවීන් කරදරයට පත්වන සමයකි. තමන්ගේ අවශ්‍යතා සහ මුදල් සඳහා සතුන් විකිණීමට මේ කාලයේ දී ගොවීන් නිතැතින් ම පෙළඹෙති. මේ කාලය මෝසම් නිසාවෙන් මාළු හිඟවීම හා මිළ ඉහළ යෑම මස් සඳහා ඉල්ලුම තවත් වැඩි කරවන හේතුවකි.

### සැපයුම

මස් අනුභව රටාවද මේ කාලයේ සැපයුමට සරිලන පරිද්දෙන් වෙනස් වේ. ජනවාරි-මැයි කාලය තුළ මරනු ලබන සතුන් සංඛ්‍යාව අඩු වේ. සැප්තැම්බර් දෙසැම්බර් වැඩි සතුන් සංඛ්‍යාවක් මරනු ලබන කාලයයි. දෙසැම්බර් මස් ඉල්ලුම හා සැපයුම වැඩිම මාසය වේ. හරක් මස් වෙළඳාම සම්ප්‍රදායිකව මුස්ලිම් ජාතිකයන් විසින් කරනු ලබන්නක් වන අතර, බස්නාහිර පළාත ආසන්න වෙරළ බඩ පළාත් හා මධ්‍යම පළාත මස් අනුභවය වැඩිව සිදු වන ප්‍රදේශ වේ.

සත්ව පෝෂ්‍ය පදර්ථ ලබා දෙන මස්, කිරි, කිරි නිෂ්පාදන හා බිත්තර සඳහා ඉල්ලුම වසරින් වසර වැඩි වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණ මගින් හෙළිව ඇත. ජනගහණයේ සීඝ්‍ර වර්ධනය හා වෙනස්වන ජනතා ආහාර රුචියට සරිලන අයුරින් මස් සැපයුම වැඩි කිරීමට කිසිදු ස්ථිරසාර පදනමක් මෙතෙක් නොගෙන තිබීම අප මස් කර්මාන්තයේ තවත් ලක්ෂණයකි. දේශීය ගවයින් ගේ වැඩීමට සැහෙන කාලයක් ගත වේ. දනට ඇති ගව සම්පත රැක ගැනීමට නම් වාර්ෂික ඝාතක ප්‍රමාණය ගව සම්පතේ දළ වාර්ෂික වැඩිවීමට සමාන වන අයුරින් පැවතිය යුතුය. ඇතැම් වසරවල මෙය එසේ සිදුවුනද සමහර වර්ෂවල ඝාතක ප්‍රමාණය දළ උත්පත්ති ප්‍රමාණයන්ට ඉහළ බව ද හෙළි වී ඇත. මේ නිසා මස් කර්මාන්තය සංවිධානාත්මක පදනමකට එනතුරු ඝාතක ප්‍රමාණය කෙසේ හෝ දළ උත්පත්තියට සමානව පැවතිය යුතු බව මේ ගැන දැඩි අවධානය යොමු කරන අයගේ අදහස වී ඇත.

### සම්පත් වැනසීම

ඉල්ලුම කෙසේ හෝ සැපයීම සඳහා කෙටවු, නොමේරූ සතුන්මෙන් ම කිරි හරක් ද, මස් පිණිස මරන බව හෙළි වී ඇත. සාමාන්‍ය ඝාතන ප්‍රමාණයෙන් 40% ක් පමණ මෙසේ අයෝග්‍ය සතුන් වේ. මෙය ජාතික සම්පතක් නිකරුනේ විනාශ කිරීමකි.

මරනු ලබන සතුන් ප්‍රමාණය නිවැරදිව ගණින්නේ වෙළඳ පොලට ලැබෙන හම් ප්‍රමාණයෙනි. එහෙත් පළපුරුදු ඝාතකයන් හා මස් කරන්නන් නොමැතිවීම නිසා හම් වැඩි ප්‍රමාණයක් අපතේ යයි. සපත්තු හා සෙසු හම් භාණ්ඩ නිපදවීමට තුවාල සිදු නොවූ හම් අවශ්‍ය ය. මස් කිරීමේ දී මෙන් ම, හරක් හණ ගැසීමේ දී, කටු කම්බි වැටවල් වලින් රිංගුමේ දී සිදුවන තුවාල නිසා සැහෙන හම් ප්‍රමාණයක් වැඩකට ගත නොහැකි තත්වයකට පත් වේ. 1963-67 කාලය තුළ අපතේ ගිය හම්වල වටිනාකම රුපියල් කෝටි එකහමාරක් පමණ වේ.

මේ හැර ලේ, ඇටකටු, අං හා කුර, මෙන් ම හරක් වූ මස් වලින් ලබාගත හැකි වටිනා අතුරු නිෂ්පාදන කිසිවක් මෙරට නිපදවන්නේ නැත. දිවයිනේ කිසිම ගව ඝාතකාගාරයක වත් මෙම සුන්බුන් එකතු කර අතුරු නිෂ්පාදන සෑදීමට යොදගන්නේ නැත. කොළඹ මහ නගර සභාව සමණක් ඉතා කුඩා අතුරු නිෂ්පාදන ඒකකයක් පිහිටුවා ඇත. 1963-67 කාලය තුළ මෙහි දී නිපදවීමට හැකියාව තිබූ අතුරු නිෂ්පාදන වල වටිනාකම රුපියල් ලක්ෂ 65 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත.

### පාලන මිල

පසුගිය වසර කිහිපය තුළ මස් සඳහා වූ දැඩි ඉල්ලුම නිසාවෙන් මස් මිළ ඉහළ ගොස් ඇත. 1967 ශත 95 ක් වූ පාලන මිළ දන් රු. 3.50 ක්ව ඇත. එහෙත් සාමාන්‍ය වෙළඳ පොලේ කටු මස් රාත්තලක මිල රුපියල් පහක් වෙයි. මෙසේ පාරිභෝගිකයන් ගෙවන වැඩි මුදල ලැබෙන්නේ කාටද? නිෂ්පාදකයන්ට ද? නැත. 1968 දී මස් රාත්තලක පාලන මිළ රු. 1.25 ක් විය. එවිට නිෂ්පාදකයාට ලැබුනේ රාත්තලකට ශත 30 ක් පමණ බව ගණන් බලා ඇත. මස් සඳහා පාලන මිලක් පනවන හැම අවස්ථාවක ම තම මස් කඩ වැසීම වැනි ක්‍රියාවලින් මස් වෙළෙන්දන් විරෝධය පළ කොට ඇත. මස් මිළ රු. 3.50 ක් කළ අවස්ථාවේ එම මිලට විකිණීම නිෂ්පාදන වියදමෙන් 20% පමණ පාඩු වෙතැයි ඔවුහු රජයට කරුණු ඉදිරිපත් කළහ. එහෙත් මස් සැපයුම හා කඩ සඳහා ටෙන්ඩර් කැඳ වූ විට ඉතා විශාල මුදල් ගෙවීමට ඔවුන්ම ඉදිරිපත් වීම මස් වල රස අන් කාටත් වඩා ඔවුන්ට දනෙන බව කදිමට පෙන්වීමකි.

දේශීය ඉල්ලුමට සරිලන සේ මස් සැපයුම වැඩි කිරීමට නම් මස් වෙළඳාම නිෂ්පාදක-පාරිභෝගික යන දෙදෙනාගේ යහපත තකා සකස් විය යුතු බැව් කිවමනා නොවේ. පාරිභෝගිකයා මස් රාත්තලකට ගෙවන මුදලින් හරි අඩක්වත් නිෂ්පාදකයාට නොලැබෙන්නේ නම් ක්‍රමානුකූල මස් සැපයුමක් ඇති කළ නොහැක.

1. ගොවීන්ට නැතිනම් හරක් අයිතිකරුවන්ට කාල සීමාවන්හි වෙනස්වීම හා නොබැඳුණු ස්ථිර සාධාරන මිලක් දීම.
2. පාරිභෝගිකයාට හැම විටකම සාධාරන මිලකට හොඳ මස් සැපයීම.
3. ජාතික ගව සම්පත තුළ වැඩිවීම නොඉක්මවන අයුරින් වාර්ෂික ඝාතන ප්‍රමාණය සීමා කර ගව සම්පත රැක ගැනීම යන මූලික

කරුණු තුන ඉටුවන අයුරින් ජාතික මස් කර්මාන්තය මුළුමනින්ම ප්‍රතිසංවිධානය කළයුතුව ඇත. මෙය ඉටු කිරීමට නම් මස් කර්මාන්තය තම අණසකට නතු කරගෙන සිටින අතරමැදියන් ගේ තැනට රාජ්‍ය ආයතනයක් පැමිණිය යුතුව ඇත. මෙහිලා නිෂ්පාදක පාරිභෝගික පදනම යටතේ ඉතා සාර්ථක මස් කර්මාන්ත ඇති අපට ආදර්ශයට ගත හැකි රටවල් අපමණ ය.

# මස් සැපයුමට රාජ්‍ය ආයතනයක්?

මෙරට ජනතාවට මස් සැපයීම විධිමත් කිරීම පිණිස ගත් මුල් පියවර 1973 දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පිහිටුවීම ය. මේ සඳහා පදනම සකස් වූයේ මෙරට මස් කර්මාන්තය පිළිබඳව කරුණු පිරික්සීමට 1968 පත් කරන ලද කොමිටි වාර්තා වකිනි.

හරක්, එළු, ඌරු හා කුකුල් පාලන කටයුතු පිළිබඳ තත්වය පිරික්සා මස් නිෂ්පාදනය විධිමත් කිරීම පිළිබඳ සුදුසු නිර්දේශ කිරීම කමිටුවට භාර විය. තණ බිම්, සත්ව ආහාර, ප්‍රජනන ද්‍රව්‍ය සැපයීම ගැන ද අවධානය යොමු කෙරුණි. 1969 දී රජයට භාර දෙන ලද කමිටු වාර්තාවේ මූලික නිර්දේශ වූයේ මෙරට මස් කර්මාන්තය පිළිබඳ වගකීම භාර වන මධ්‍යම රාජ්‍ය ආයතනයක් පිහිටුවීම ය. දිවයිනේ තිබෙන කුඩා ගව ඝාතකාගාර සියල්ල නිර්දේශිත මධ්‍ය ආයතනයට පවරා ගෙන ආර්ථික වාසි සලසන ගව ඝාතකාගාර ආයතනය මගින් පිහිටුවීම වාර්තාවේ වැදගත් ම නිර්දේශය විය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූලික ක්‍රියා දාමයන් මෙසේ විය යුතු යැයි තීරණය කෙරුණි.

* සතුන් ඇති කරන්නන් ගෙන් සාධාරණ මිලකට මස් පිණිස සතුන් මිළ දී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.
* සතුන් මරා පිරිසිදු කර දෙන නව සත්ව ඝාතකාගාර අවශ්‍ය පරිද්දෙන් පිහිටුවීම.
* මස් හා මස් නිෂ්පාදන පැසුරුම් කිරීම හා අලෙවි කිරීම.

මෙම කටයුතු ඉටු කිරිමේලා මණ්ඩලයේ සැලැස්ම අගැයීමට ඩෙන්මාර්ක් ජාතික විශේෂඥයකු ගේ සේවය ද ලබා ගන්නා ලදී.

දිවයිනේ සත්ව ඝාතන රටාව නවීකරණය කරමින් නව ප්‍රධාන ඝාතනාගාර තුනක් පිහිටුවීම නිර්දේශ විය. ප්‍රධාන ඝාතනාගාරය දිනකට වැඩ කරන පැය හයක් තුල දී හරක් 500 ක්, එළුවන් 500 ක් හා ඌරන් 75 ක් මැරීමට සමත්වේ. මෙය අලවුවේ පිහිටුවීමට යෝජනා කෙරුණි. කටුගස්තොට මධ්‍යම ඝාතනාගාරය දිනකට හරක් 250 ක්, එළුවන් 200 ක් ද, කටුකුරුන්ද ඝාතනාගාරය දිනකට හරක් එළුවන් 50 බැගින් ඝාතනය කිරීමට හැකි අයුරින් සැලසුම් කිරීමට නිර්දේශ කෙරුණි. මේ හැර දිවයිනේ සෙසු පෙදෙස් සඳහා ඒ පළාත්වල මස් අවශ්‍යතාවයන් අනුව සැලසුම් වෙන ඉතා කුඩා ඝාතනාගාර පිහිටුවීම නිර්දේශ විය.

දිවයිනේ විවිධ පළාත්වල පිහිටුවන සතුන් මිලට ගැනීමේ මධ්‍යස්ථාන 16 ක සිට ඝාතනාගාරවලට අවශ්‍ය සතුන් ප්‍රවාහනය කිරීම හා මස් කළ සතුන් උදෑසන අට වන විට මස් කඩවලට ගෙනවිත් දීමට හැකි වන අයුරින් ප්‍රවාහන රටාවක් ද මෙම වාර්තාව මගින් සැලසුම් කර ඇත.

සනීපාරක්ෂක අවශ්‍යතාවයන් යටතේ මසට සුදුසු සතුන් පමණක් ඝාතනය කෙරෙන මෙවැනි සැලැස්මක් මගින් දිවයිනට අවශ්‍ය මස් සැපයීම රාජ්‍ය ආයතනයක් මගින් කිරීම මස් කර්මාන්තයේ දැනට තිබෙන සියළුම දුර්විපාක නැති කළ හැකි එකම මාර්ගය බව මේ පිළිබඳ මනා තතු දන්නෝ එක හෙළාම පවසති. සතුන් අයිතිකරුවන්ට සාධාරණ මිලක් දී පාරිභෝගිකයාට සාධාරණ මිලකට උසස් තත්වයේ මස් සපයමින් ජාතික ගව සම්පත රැකෙන අයුරකින් අප මස් කර්මාන්තයසංවිධානය කළ හැකි එකම මඟ මෙය බව සැක නැත.

---

## ළමයි ලැස්තියි-බස්එක එවන්න

ළමුන් විනෝද ගමනට සූදනම්. බස් එක එවන්න. මේ පොළොන්නරුවෙන් මහනුවර වැසියෙකුට ලැබුණ විදුලි පණිවුඩයක්. විදුලි පුවත ගැන සැක සිතූ තැපැල් පති පොලීසියට දැන් වූවා. විදුලි පණිවුඩය ලැබූ තැනැත්තා පසුදම ලොරියකින් පොළොන්නරුවට ආවා. පොලීසියත් ලොරිය පසුපස පොළොන්නරු ගියා. විනෝද ගමනට සූදනම්ව සිටි 'ළමුන්' හොර හරක් රංචුවක් බව පොලීසිය හොයා ගත්තා. මේ ළඟ දී පුවත් පතක පළ වූ ප්‍රවෘත්තියක්.

මනම්පිටියේ ජුනයිඩ් ගේ දුක් ගැනවිලි අතර මුල් තැනක් ගත්තේත් හොර හරක් ජාවාරමයි

මගේ පට්ටියට හරක් 75 ක් ඉන්නවා. කිරි එළ දෙනුන් 12 ක්. පහුගිය කාලේ මගේ හරක් දෙළහක් හොරු ගත්තා. අපිට පැය විසි හතරේම හරක පස්සේ ඉන්න වෙලා. හොරුන්ට මේ ගමේ අත් උදව් කාරයෝ ඉන්නවා. රෑට ගාල් වලින් හරක් පන්නනවා. නැත්නම් දවල්ට කැලේට දක්කුවා ම පන්න ගන්නවා. දැන් මම කැලේදීත් හරක් බලා ගන්න එක්ක තවත් ගැටයෙක් දමලා. එයාටත් රු 35/= ක් ගෙවන්න ඕන මස් කාරයන්ට හරක් එකතු කරන උන් හරක් ටිකක් සල්ලි වලට අරන් වැඩි හරිය හොරෙන් ගන්නවා. රෑට ලොරි කාරයෝ එනවා. මේක හරිම වසංගතයක්. මම දැන් සිංහල ඉංග්‍රීසි ටිකක් ඉගෙන ගන්නවා. හරක් පට්ටිය විකුණවා